**මාර්ග නඩත්තු භාර අරමුදල - 2013**

**------------------------------------**

මාර්ග නඩත්තු භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාණ්ඩාගාර ලේකම් සහ මාර්ග නඩත්තු භාර අරමුදලේ භාරකරුවන් අතර 2005 දෙසැම්බර් 09 දින එළඹි මාර්ග නඩත්තු භාර ඔප්පුවේ 11 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මාර්ග නඩත්තු භාර අරමුදල පිහිටුවීම**

**------------------------------------**

භාර ආඥාපනත යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව 2005 දෙසැම්බර් 09 දින අත්සන් කරන ලද භාර ඔප්පුව මඟින් මාර්ග නඩත්තු භාර අරමුදල (මා.න.භා.අ) පිහිටුවා ඇති අතර ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර) මෙහෙයුම් කටයුතු සිදුකර ඇත. ආරම්භයේදී මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ) නඩත්තු කරන මාර්ග සඳහා මාර්ග නඩත්තු භාර අරමුදලට අරමුදල් සපයනු ලබන අතර පසුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නඩත්තු කරන මාර්ග ද මාර්ග නඩත්තු භාර අරමුදලට ඇතුළත් වේ. ඒ අනුව ඒ හා බී පන්තියේ මාර්ග නඩත්තු කිරීම සඳහා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන මාර්ග සංවර්ධන අධිකාරිය මාර්ග නඩත්තු භාර අරමුදලෙන් මාර්ග නඩත්තු කිරීම සඳහා ගෙවන අරමුදල්වල වර්තමාන ප්‍රධාන ප්‍රතිලාභියා වේ. මාර්ග නඩත්තු භාර අරමුදල භාර මණ්ඩලයක් මඟින් කළමනාකරණය කරනු ලැබේ. වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ මාර්ග නඩත්තු භාර අරමුදලට මුදල් සපයනු ලැබේ. ශ්‍රී ලංකා රජයේ අරමුදල් සමඟ කාලීන නඩත්තු කටයුතු සඳහා මූල්‍යනය කිරීමට සහ භාර අරමුදලේ පුනරාවර්තන වියදම් සඳහා එ.ජ. ඩොලර් මිලියන 0.5 ක් වශයෙන් මාර්ග අංශ සහාය ව්‍යාපෘතිය හරහා 2012 වර්ෂයේ සිට 2014 සැප්තැම්බර් දක්වා එ.ජ. ඩොලර් මිලියන 10 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය ආරම්භයේදී එකඟ වී තිබුණි.

**1.3 භාර අරමුදල**

**---------------**

**භාර අරමුදලේ අරමුණු**

**------------------------**

භාර ඔප්පුවේ 4 වගන්තිය අනුව භාර අරමුදලේ අරමුණු වන්නේ,

(අ) මාර්ග ජාලයේ පිරිහීම වළක්වා ගැනීම සඳහා ජාතික මාර්ගවල සාමාන්‍ය හා කාලීන මාර්ග නඩත්තු වැඩසටහන් සඳහා මූල්‍යනය කිරීම.

(ආ) මාර්ග නඩත්තු කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල් හෝ කොටසක් සුදුසු ආකාරයට ආයෝජන කළඹක හා සුරැකුම්වල විචක්ෂණව හා සුපරීක්ෂාකාරීව ආයෝජනය කිරීම, රඳවා ගැනීම, විකිණීම හෝ වෙනත් ආකාරයකට අපහරණය කිරීම තුළින් එම ආයෝජන හා සුරැකුම්වලට ඉහළම ප්‍රතිලාභයන් සහතික කිරීම මඟින් භාර අරමුදල කළමනාකරණය හා සංවර්ධනය කිරීම.

(ඇ) භාරයේ අරමුණු සඳහා පාදකවන සහ හෝ අවශ්‍ය වන පරිදි රටේ පවත්නා නීතියට අනුව රජයේ හෝ වෙනත් අධිකාරියකින්, අයිතියකින්, වරප්‍රසාදයකින්, බලපත්‍ර සහ සහන ලබාගැනීම.

(ඈ) ඕනෑම ආකාරයකින් රැස්කරගන්නා ආදායම්, භාරයේ ඉහත අරමුණු වර්ධනය කර ගැනීම සඳහා යෙදවිය යුතු අතර එම ආදායම මුදලින් හෝ වෙනත් ආකාරයකින් පුද්ගලයන් හෝ ආයතනවලට භාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා නොවන කාර්යයන් සඳහා බෙදා නොහැරිය යුතුය.

(ඉ) භාරයේ ඕනෑම අරමුණක් ඉටුකර ගැනීමට අදාළ වන අනුශාංගික හෝ යෝග්‍ය වන නීත්‍යානුකූල දේ කිරීමට,

(ඊ) භාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඔවුන් සිතන වඩාත් උචිත ක්‍රියාවෙහි යෙදීම සඳහා ඔවුන්ගේ පරිදි බලය සහ අභිමතය පරිදි පැවරීමට භාරකරුවන් සහතික වීම.

## 1.4 ප්‍රතිලාභීන්

------------

භාර අරමුදල් ඔප්පුවේ 07 වගන්තිය අනුව, භාරයේ ප්‍රතිලාභීන් වන්නේ මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ ඔවුන්ගේ පසුප්‍රාප්තික ආයතන වශයෙන් රජය විසින් අනුමත කරන ආයතන සහ භාර අරමුදලෙන් අරමුදල් ලබාගැනීමට බලය ලැබෙන ආයතන වේ.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.6 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටී සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.7 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මාර්ග නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල භාණ්ඩාගාර බිල්පත් ආයෝජන වටිනාකම රු.129,810 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලෝක බැංකුව විසින් මූල්‍යනය කරන ලද කාලීන අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාතකරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 63.395 ක මුදල ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඇ) අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව, මුළු පිරිවැය රු.203,127,778 ක් ලෙස පෙන්වා තිබුණු අතර මහාභාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.227,259,039 ක් වූයෙන් රු.24,131,261 ක වෙනසක් දක්නට තිබුණි.

#### 2.2.2 නීතිරීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-----------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී/එෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

| | | |
|---|---|---|
| (i) | 4 වගන්තිය | භාර අරමුදලේ වාර්ෂික අයවැය පෙර වර්ෂයේ සැප්තැම්බර් 15 දින හෝ ඊට පෙර පිළියෙල කර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ට හා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික අයවැය ලේඛනය අවශ්‍ය පරිදි පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | 4.3 වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තා හා සමුච්චිත අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශනය නියමිත පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දි නැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය | විගණන කමිටු මාස 3 කට එක් වරක්වත් අවම වශයෙන් විධිමත් පරිදි රැස්විය යුතු වුවත් අවශ්‍ය පරිදි එසේ රැස්වී නොතිබුණි. |

**3 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------------**

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම 5,359,022,747 සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.15,569,057,202 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **වියදම් වර්ගය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම්** | | **දෙසැම්බර් 31 දිනට සම්මුච්චිත වියදම** |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘති | 5,113,398,350 | 1,332,000,000 | 15,319,398,350 |
| සාමූහික මූල්‍යනය කළ ව්‍යාපෘති | 239,229,429 | - | 239,229,429 |
| නඩත්තු භාර අරමුදලේ ලේකම් කාර්යාල වියදම් | 6,394,968 | 4,034,455 | 10,429,423 |
| | 5,359,022,747 | 1,336,034,455 | 15,569,057,202 |

**3.2 කාර්යසාධනය**

**-----------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මාර්ග නඩත්තු භාර අරමුදල් ලේකම් කාර්යාලය, පිළිගත් මාර්ග නඩත්තු ප්‍රමිතීන් / අත්පොත් භාවිතා කර මාර්ග නඩත්තුව පිළිබඳ තාක්ෂණික විගණනයන් නියැදි පදනම මත අඛන්ඩව සිදු කළ යුතු අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක වලට අනුව මාර්ග නඩත්තුවේ ගුණාත්මක භාවය තහවුරු කළ යුතුය. මාර්ග නඩත්තු භාර අරමුදලේ ලේකම් කාර්යාලය නියැදි පදනම මත තාක්ෂණික විගණනයන් සිදු කර තිබුණු නමුත් විවිධ අඩුපාඩු වාර්තා කිරීම සඳහා අදාළ හා උචිත නිර්නායකයන් හඳුනා ගැනීම සහ යොදාගැනීම කර නොතිබුණි. තවද, අදාල පාර්ශවයන් විසින් හඳුනාගත් වැරදි නිවැරදි කිරීමට පියවර ගෙන තිබුණු බවට වූ සාක්ෂි විගණනයට ලැබී නොතිබුණි.

(ii) භාර ඔප්පුවේ 19 වන වගන්තිය ප්‍රකාරව, තිරසාර ලෙස මාර්ග නඩත්තු මුල්‍යනය සැපයීම, භාර අරමුදලේ ඵලදායිත්වය තක්සේරු කිරීම හා මෙහෙයුම් වර්ධනය කිරීමේ මාර්ග පරීක්ෂා කිරීම සඳහා භාර අරමුදල ආරම්භයේ සිට වර්ෂ තුනකට පසු භාර අරමුදලේ කටයුතු සමාලෝචනය තුළ යුතුය. අරමුදල, 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණු නමුත්, භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩලය අරමුදලේ භෞතික හා මුල්‍ය කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(iii) 2005 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 04 වැනි ඡේදය අනුව 2006 ජනවාරි 01 දින සිට පෙට්‍රල් සහ ඩීසල් අලෙවියෙන් රජයට ලැබෙන ආදායමෙන් පෙට්‍රල් ලීටර් 01 කින් රු.1 ක් හා ඩීසල් ලීටර් 01 කින් ශත 50 බැගින් වෙන්කර භාර අරමුදල වෙත බැරකල යුතුය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵලය සාක්ෂාත් කරගත නොහැකි විය.

(iv) ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ මාර්ග සහයක ව්‍යාපෘතිය සමඟ අත්සන් කර තිබුණු ව්‍යාපෘති සටහන අනුව 2013 දෙසැම්බර් 31 දිනට කාලීන නඩත්තු කටයුතු සඳහා ඇ.එ.ජ ඩොලර් මිලියන 7 ක් උපයෝජනය කළ යුතුය.කෙසේ වුවත් මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 203 කට සමාන ඇ.එ.ජ ඩොලර් මිලියන1.5 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(v) මාර්ග සංවර්ධන අධිකාරියෙහි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග වැඩ සඳහා මුල්‍ය ප්‍රතිපාදන පැවතියද, බස්නාහිර පලාතේ " ඒ " හා " බී " මාර්ග නඩත්තු සඳහා අනුමත කර තිබුණු රු.828,829,239 ක මුදලින් රු 22,230,726 ක් මාර්ග නඩත්තු භාර අරමුදල හරහා උපයෝජනය කර තිබුණි.

(vi) මාර්ග අංශ සහයක ව්‍යාපෘතිය යටතේ මාර්ග නඩත්තු භාර අරමුදලේ ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා තාක්ෂණික සහාය උපදේශන සේවය ලබා ගැනීම වෙනුවෙන් රු.81,550,939 ක මුදලක් වැය කර තිබුණු නමුත් උපදේශකවරයා විසින් හඳුන්වා දී තිබුණු ප්‍රතිපත්තීන් සඳහා වූ පහත සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

| ප්‍රතිපත්ති අංකය | විස්තරය | නිරීක්ෂණය |
|---|---|---|
| xix | භාර අරමුදල් මණ්ඩලය විසින් අනුමත කර, ප්‍රසිද්ධ කර තිබෙන මාර්ග යෝජනා සම්බන්ධයෙන් පමණක් භාර අරමුදල් ලේකම් කාර්යාලය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය/ මාර්ග නියෝජිත ආයතන වලට අරමුදල් නිදහස් කළ යුතුය. | රු.මිලියන 5,352.6 ක් වූ මාර්ග යෝජනාවන් ක්‍රියාත්මක කිරීම සඳහා භාර අරමුදල් මණ්ඩලයේ අනුමැතිය ලැබී නොතිබුණි. |
| xxi | මාර්ග නඩත්තු භාර අරමුදලේ ලේකම් කාර්යාලය, මාර්ග නියෝජිත ආයතන සම්බන්ධ මුල්‍ය විගණනයන් නියැදි පදනම මත අඛණ්ඩව සිදු කළ යුතුය. | මාර්ග නඩත්තු භාර අරමුදල කිසිදු මුල්‍ය විගණනයක් සිදුකර නොතිබුණි. |
| xxix | එලඹෙන වර්ෂය සඳහා මාර්ග නඩත්තු භාර අරමුදලේ ලේකම් කාර්යාලය එහි කළමණාකරනය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය. | අයවැය ලේඛනයක් පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**3.3 භෞතික කාර්යසාධනය**

**----------------------------**

2013 දෙසැම්බර් 31 දිනට මාර්ග නඩත්තු භාර අරමුදලට සම්බන්ධිත මාර්ග නඩත්තු වැඩ සම්බන්ධ භෞතික ප්‍රගතිය ඉදිරිපත් වී ඇති තොරතුරු අනුව පහත දැක්වේ.

| විස්තරය | | 2013 වර්ෂය සඳහා වෙන්කිරීම | 2013 දෙසැම්බර් 31 දිනට වියදම | සම්පූර්ණ කළ යුතු ඉලක්කය | සම්පූර්ණ කරන ලද දිග |
|---|---|---|---|---|---|
| | | (රු.) | (රු.) | (කි.මී) | (කි.මී) |
| 01 | මාර්ග ගත නඩත්තුව | 1,835,000,000 | 2,701,633,680 | 13,204.0 | 13,204.0 |
| 02 | අඛණ්ඩ වැඩ | 1,000,000,000 | | | |
| 03 | කාලවර්තක නඩත්තු | 2,505,000,000 | 1,436,356,316 | | |
| | අධික ගල්තාර කොන්ක්‍රීට් | | | 9.0 | 7.6 |
| | වැලි මුද්‍රා තැබීමේ වැඩ<br>චිප් මුද්‍රා තැබීමේ වැඩ | | | 700.0 | 595.0 |
| | ඉරිතැලීම් මුද්‍ර තැබීමේ වැඩ | | | | |
| 04 | ව්‍යුහාත්මක වැඩිදියුණු කිරීම් | 760,000,000 | 975,408,354 | විස්තර ඉදිරිපත් වී නොතිබුණි. | |
| 05 | විදුලි නඩත්තුව, සංඥා විදුලිය, මාර්ග ලකුණු කිරීම් සහ මාර්ග ලීබඩු සවි කිරීම | 780,000,000 | | | |
| 06 | හදිසි වැඩ | 600,000,000 | | | |
| 07 | තොටුපොල වල මෙහෙයුම් හා නඩත්තු | 20,000,000 | | | |
| | එකතුව | 7,500,000,000 | 5,113,398,350 | | |

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පරිගණක ගිණුම්කරණ පැකේජයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ සේවා ගාස්තු ලෙස පිළිවෙලින් රු.113,097 ක් හා රු.12,000 ක් වැයකර තිබුණ ද ගිණුම් අතින් පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර එළඹ තිබුණු 2011 අප්‍රේල් 29 දිනැති මූල්‍ය ගිවිසුමේ ඇමුණුමේ අංක 17 ඡේදය සහ උපලේඛන 01 අනුව ලෝක බැංකු අරමුදල් උපයෝජනය කළ යුත්තේ මාර්ග නඩත්තු කටයුතු සඳහා පමණි. කෙසේ වෙතත්, ලෝක බැංකුවේ අනුමැතිය ලබානොගෙන ප්‍රාග්ධන වැඩ සහ මාර්ග නඩත්තු කටයුතු සඳහා ලෝක බැංකු අරමුදල් උපයෝජනය කර තිබුණු බව අහඹු පරීක්ෂාවන් වලදී අනාවරණය විය.

(ii) වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගය, එඩ්මන්ටන් මාර්ග සහ ගාල්ලේ බණ්ඩාරනායක මාවත සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක සම්පූර්ණ සහතික මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පිළිවෙලින් 2013 දෙසැම්බර් 23 සහ 2013 දෙසැම්බර් 24 දින වල දී නිකුත් කර තිබුණු නමුත් ඉහත කොන්ත්‍රාත් සම්බන්ධ ඉතිරි වැඩ කොටස් 2014 අප්‍රේල් 04 වැනි දින වන තෙක් සම්පූර්ණ කර නොතිබුණි.

**3.6 මානව සම්පත් කළමනාකරණය**

2011 අගෝස්තු 09 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව මාර්ග නඩත්තු අරමුදලේ ගණකාධිකාරී සහ කළමනාකරණ සහකාර තනතුරු සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.7 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව කුළී පදනම මත පුද්ගලික හිමිකරුවකුගෙන් වාහන තුනක් මාර්ග සංවර්ධන නඩත්තු අරමුදල විසින් ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.2,137,367 ක වාර්ෂික කුළී ගෙවීමක් කර තිබුණි. මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන නඩත්තු අරමුදල විසින් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) මාර්ග නඩත්තු භාර අරමුදල මඟින් වාහන 03 ක් කුළී පදනම මත ලබාගෙන තිබුණ ද, එම වාහන වල පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියෙකු නොවීය.

(iii) වාහනය භාර රියදුරු විසින් දෛනික ධාවන සටහන් පිළියෙල කර පරිපාලන නිලධාරියෙකු විසින් එය පරීක්ෂා කළ යුතු වුවද, මුදල් රෙගුලාසි 1645 ට පටහැනිව 2013 ජනවාරි 08 දින සිට 2013 ජුනි 10 දක්වා වාහනයේ ගමන් කරන ලද නිලධාරියා විසින් ධාවන සටහන් පිළියෙල කිරීම සහ අත්සන් කිරීම සිදුකර තිබුණි.

**4 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 ඡේදයට අනුව ක්‍රියාකාරී සැලැස්ම හා සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

විගණනයෙදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර භාර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) වාහන උපයෝජනය

(ආ) භාර අරමුදලේ මෙහෙයුම්

(ඇ) ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම.